ආදරණීය දුවේ පුතේ,

සුදුසු ක්‍රියා පද යොදා හිස් තැන් පුරවන්න.

මිහිරි නිවැරදි ව අකුරු ලියයි.
රාෆි නිවැරදි ව අකුරු ලියයි.
මිහිරි ද රාෆි ද නිවැරදි ව අකුරු . . . . . .

සවිඳු කීකරු ව සිටියි.
පසිඳු කීකරු ව සිටියි.
සවිඳු ද පසිඳු ද කීකරු ව . . . . . .

අම්මා පලතුරු සලාද සාදයි.
නැන්දා පලතුරු සලාද සාදයි.
ලොකු අම්මා පලතුරු සලාද සාදයි.
අම්මා ද නැන්දා ද ලොකු අම්මා ද පලතුරු සලාද . . . . . .

මාමා වේදිකා නාට්‍ය නරඹයි.
සීයා වේදිකා නාට්‍ය නරඹයි.
මාමා ද සීයා ද වේදිකා නාට්‍ය . . . . . .

කවීෂ කිරි අලුවා කයි.
කවීෂා කිරි අලුවා කයි.
ආර්ති කිරි අලුවා කයි.
කවීෂ ද කවීෂා ද ආර්ති ද කිරි අලුවා . . . . . .

පහත සඳහන් වාක්‍ය නිවැරදි පිළිතුර යටින් ඇති පදවලින් තෝරා ලියන්න.

1* ඉසුරු ද මලිති ද ගගනි ද පාසල් . . . . . .
2* ආච්චි අම්මා ද සීයා ද ගීතයක් . . . . . .
3* මල්ලී ද අයියා ද පොත්වලට පිටකවර . . . . . .
4* නැන්දා ද මාමා ද සීයා ද පත්තර . . . . . .
5* පවනි ද පවන් ද පිරිසිඳු වතුර පානය . . . . . .

කරයි. දමයි. යයි. රස විඳියි. බලයි.
කරති. දමති. යති. රස විඳිති. බලති.